WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,584 — 1958 නොවැම්බර් 14 වැනි සිකුරාද — 14.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යෙදූ ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 993 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 1017 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 1023 |


## අතුරු ව්‍යවස්ථා

ඇල්.ඕ.—බී. 247/40/ඇල්.ජී.ඕ.—ජීඒ 11/2/3.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩපනේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවැරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

වර්ෂ 1958ක් වූ ඔක්තෝබර් මස 29 වෙනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථ වාහනයක් හෝ සතෙකු ඇතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ හෝ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් එකී උපලේඛනයක් සම්පූර්ණ කොට 1956යේ මාර්තු මස 31 වෙනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා අයිතිව, භාරව හෝ පාලනය යටතේ තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 වෙනුවෙන් ඒ අවුරුද්දේ සැප්තැම්බර් මස 30 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් 30කට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ පාලනය පිට හෝ තිබෙන්නා වූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු, යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපනත යටතේ යම් රථ වාහනයක් හෝ සතෙකු අත්පත් කර ගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවෙනි වරට අත්පත් කර ගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහන යක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමේ හෝ

පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යා කොට ඇති උපලේඛනයේ සඳහන් "ඒ" පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු, සෑම අයෙක්ම එකී උපලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද, ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු, ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු, ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මීට යාකොට ඇති "බී" උප ලේඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු කිසියම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නො පැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් ශත විසි පහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැන්වීමට සෑලැස් වුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත පනහක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයක අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථ වාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් හෝ ඕනෑම මාවතක් හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථ වාහනයක් ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවි කොට තිබිය යුතු තහඩුව පරීක්‍ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද, ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාර කාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්‍ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි.

9. කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව 1941 මැයි මස 16 වැනි දින අංක 8,746 දරන ගැසට් පත්‍රයේ පළවූ රථවාහන සහ සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. "ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය්‍ය සභාව" යනුවෙන් උඩපනේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝර්මය

උඩපනේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව—රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ ලේඛනයයි

අයිතිකාරයාගේ නම :————.

අයිතිකාරයා හෝ භාරකාරයා පදිංචි ස්ථානයේ නම :————.

ගම :————.

ලිපිනය :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචනවලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ අංකය) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ | | |
| කරත්ත හැර ඕනෑම අන්දමක වාහන | | |
| ගොන් දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල | | |
| තනි ගොනා බඳින කරත්ත හෝ තිරික්කල, ජින් රික්ෂෝ කරත්ත | | |
| බයිසිකල් ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ප්‍රකාශය සත්‍යය බවට මෙයින් සහතික කරමි.

————,
අයිතිකාරයා හෝ භාරකාරයාගේ අත්සන.

දිනය :————.

* නුවමනා වචන කපාදමනු.

## "බී" උප ලේඛනය

### පෝර්මය

| | |
|---|---|
| සෑම ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | වී.සී.යූ.ඩී. |
| සෑම තනි ගොනා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | වී.සී.යූ.එච්. |
| සෑම බයිසිකලයක් සඳහා ... | වී.සී.යූ.බී. |

ඇල්.ඩී.—බී. 81/46/ඇල්.ජී.ඩී.—ජීඒ 11/14/5.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් සංශෝධිත කරන ලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 නොවැම්බර් 5 වැනි දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථාව

1956යේ ඔක්තෝබර් මස 19 වැනි දින අංක 10,933 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථාවෙන් සංශෝධිතවූ 1954රේ ජූනි මස 25 වැනි දින අංක 10,685 දරණ ගැසට් පත්‍රයේ පළවූ අන්තරාදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, එහි 9 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි, ඒ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ "රා එකතු කිරීමේ ස්ථානයක් තබාගැනීම" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අලුත් කාරණය යෙදීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ. එනම් :—

"දුම්කොළ ගබඩා කිරීම".

ඇල්.ඩී—බී. 13/47/ඇල්.ජී.ඩී—ජී 11/7/4.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගන්නෑව ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 නොවැම්බර් 5 වැනි දින,
කොළඹදීය.

### අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත

1. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කොප්පරා වේලීම;
(2) කබුක්ගල් හෝ බොරලු ලබාගැනීමට ගල් වලක් කැපීම;
(3) කොප්පරා ගබඩා කිරීම;
(4) පිදුරු ගබඩා කිරීම;
(5) මිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම;
(6) පැඟිරිතෙල් හිදීම;
(7) කුරුඳු තෙල් හිදීම;
(8) කෙඳිවර්ගී තෙලීම හෝ ගබඩා කිරීම;
(9) අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් තබාගැනීම;
(10) කපාපු පොල් සකස්කිරීම;
(11) කපු පුලුන් නූල් ආදිය ගබඩා කිරීම;
(12) ලීමඩුවක් තබාගැනීම;
(13) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම;
(14) ස්වර්ණාභරණ සෑදීම;
(15) කම්හලක් තබාගැනීම;
(16) හාල් මෝලක් තබාගැනීම;
(17) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම;
(18) මුද්‍රණාලයක් තබාගැනීම;
(19) මෝලෙන් හෝ සෙක්කුවෙන් පොල්තෙල් සිදීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම;
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුලු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම;
(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘතිම පොහොර හෝ සෑදීම;
(4) විනාකිරි සෑදීම;
(5) සබන් සෑදීම;
(6) හම් පදම්කරන ස්ථානයක් තබාගැනීම;
(7) ලැලි පොගවා සකස් කිරීම;
(8) සෝඩා සෑදීම;
(9) දුම්කොල සකස් කිරීම හෝ වියලීම;
(10) සුරුට්ටු සෑදීම;
(11) රා එකතු කරන ස්ථානයක් තබාගැනීම;
(12) බීඩි සෑදීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි සායම් කිරීම;
(2) ගඩොල් හෝ උළු පිච්චීම;
(3) බැටරි චාජ් කිරීම;
(4) හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම, හෝ කැබලි කිරීම.

## ගම්සභා ආඥාපනත

ජීබී 14/4/2.

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ හික්කඩුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබද
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 ඔක්තෝබර් 30 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථා

#### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම් කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැක.

(2) ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණ කොට 1958 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වැත් එකී අයගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයෙහි සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ අප්‍රියෙල් මස 30 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාල යක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ අප්‍රේල් මස 30 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම්කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උප ලේඛනයක් එක්කෝ නැත්තාවූ යම්කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව තවදුරටත් ප්‍රධානතුමාට දැනුම්දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වැනි ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙ වෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමා භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උප ලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද

ගෙවීමට බැඳීමෙන් ආඥපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහන හෝ සතා තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම්කිසිවකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් හෝ බද්ද අයකිරීමට එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙක් විසින් හෝ ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මීට යාකොට ඇති "බී" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද තහඩුද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පනහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්වුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහන අයිතිකරුවෙකු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියකු විසින් හෝ ඕනෑම මාවතක හෝ ඕනෑම පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්‍ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ පොලිස් නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක් භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට හෝ පොලිස් නිලධාරියාට එකී තහඩුව පරීක්‍ෂා කිරීමට ඉඩ දිය යුතුයි.

9. කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1940 නොවැම්බර් 29 වැනි දින අංක 8,687 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් හික්කඩුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### ෆෝර්මය

### හික්කඩුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා */හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය හෝ නම :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර බයිසිකලයක් නම් සාදනලද අයගේ නොම්මරය සඳහන් කරනු |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රිකෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... | | |
| ජින් රිකෂෝ රථ ... | | |
| බයිසිකල් ... | | |
| අලි ... | | |
| අශ්වයෝ ... | | |
| අශ්වතරයෝ ... | | |
| බූරුවෝ ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය බවට මම මෙයින් සහතික කරමි.

————.
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපාහරිනු.

## "බී" උප ලේඛනය

| | |
|---|---|
| අත්කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රිකෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... | හි.ර. |
| සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | හි.බ.ක. |
| සෑම තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | හි.ක |
| සෑම ජින් රිකෂෝ රථයක් සඳහා ... ... | හි.රි. |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | හි.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | හි.බ. |

---

## ගම්සභා ආඥපනත

ජීබී 14/34/1.

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹදීය.

### වෙළඳ පලවල් සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

ඕනෑම ගම්බද වෙළඳාම් පලක සිට යාර 880ක අර්ධ විෂ්කම්භයක කවයක් ඇතුළත වූ ප්‍රදේශය ඒ වෙළඳාම් පලට අයිතිවූ වෙළඳ ප්‍රදේශය හැටියට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ජීබී 14/29/7.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ බෙරලපනාතර ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද උප නීති.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹදීය.

## උප නීති

### ආයුර්වේද බෙහෙත් ශාලාව

1. (1) ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ කාර්ය සභාව විසින් ඌරුබොක්කේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්ය සභාව විසින් ම නඩත්තු කළ යුතු වාත් හැර 1941කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නා වූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේය.

(2) කාර්ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා අවශ්‍ය ඕනෑම නිලධාරියෙකු එකී නිලධාරියාට ගෙවිය යුතු වාර්ෂික වැටුප රුපියල් 480කට වැඩි නොවේ නම් පත් කළ හැකිය.

2. 1 වැනි උප නීතියේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නා වූ අයකු විසින් හෝ කාර්ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ යම් යම් පොත් පත් හා වෙනත් එබඳු සටහන්ද කාර්ය සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේය.

3. කාර්ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළ හැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්ය සභාවේ වාර්ෂික අය වැය ලෙඛනයෙන් හෝ වරින්වර කාර්ය සභාව විසින් සම්මත කරනු ලබන අතිරේක ඇස්තමේන්තුවලින් හෝ මුදල් වෙන්කළ යුතුද වන්නේය.

4. 5 වැනි උප නීතියේ සඳහන් විධිවිධානවලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර නොමිළයේ සැපයිය යුතුවාත් හැර එකී ප්‍රතිකාර බෙරලපනාතර ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන් සීමා විය යුතුද වන්නේය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධවල වටිනාකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 25 බැගින් වූ ගාස්තුවක් කාර්ය සභාව විසින් අයකළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් හෝ කාර්ය සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියකු ගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන් ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වන්නේය. එකී සෑම කුවිතාන්සිය කම කාබන් අනු පිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේය.

6. සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත් කම නිසා 5 වැනි උප නීතියේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියකු නිදහස් කළහැකි වන්නේය.

7. සභාපති තුමා විසින් දෙසැම්බර මාසයේ 31 වැනි දයින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධ යෙන් විය පැහැදම් වන මුදල් ද පෙන්නුම් කරන සටහනක් සම් පාදනය කිරීමට සැළැස්විය යුතු වන්නේය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් බෙරලපනාතර ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් පිහිටුවා නඩත්තු කර ගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ;

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ බෙරලපනාතර ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

ඇල්. ජී. ඩී—ජීසී. 14/24.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ දෙඩන්ගස්ලන්ද ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් 29 වැනි දින,
කොළඹ.

## අතුරු ව්‍යවස්ථා

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතුන් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නා වූ සෑම අයකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් "ඒ" උපලෙඛනය සම්පූර්ණ කොට 1959 ජනවාරි 31 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නා වූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගෙන් එබඳු උපලෙඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනය සැපයුවා වූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලෙඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති; තවද

(ආ) ඊටපසු එක් එක් වර්ෂය වෙනුවෙන් "ඒ" උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාල යක් තමා අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නා වූ එකී රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වැනිද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනය සැපයුවාට පසු යම් කිසිවකු විසින් ඒ උපලෙඛනයේ සඳහන් නොකරන ලද්ද වූ ද ආඥාපනත යටතේ බද්දට යටත්වූ ද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලෙඛනයක් සපයා නැත්තා වූ යම්කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක්, හෝ සතකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලෙඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලෙඛනය සැපයු වාවූ සෑම අයෙක්ම, එකී ලෙඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලෙඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නා වූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලෙඛනය හෝ සැපයුවාට පසු ඒ උපලෙඛනයට ඇතුළත් කළා වූ හෝ ලෙඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසායයි දක් වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබාගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හල බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද නහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම් ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගෙස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ ආදායම් ඕවර්සියර් වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ද ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යනුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ එබඳු වෙනත් නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍යසභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩන්ගස්ලන්ද ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### ෆෝරමය

අංකය :————.

ඡන්ද දායක කොට්ඨාශ අංකය :————.

**දෙඩන්ගස්ලන්ද ගම්කාර්‍ය සභාව**

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| බරබාග හෝ තිරික්කල ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| අත් කරත්ත ... ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ලේඛනය නිවැරදි බවත් සත්‍ය බවත් සහතික කරමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපනු.

## "බී" උප ලේඛනය

### ෆෝරමය

සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... දෙ. දෙ. ක.

සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... දෙ. ත. ක.

සෑම ජින් රික්ෂෝ කරත්තයක් සහ සෑම අත් කරත්තයක් සඳහා ... ... දෙ. අ. ක.

සෑම බයිසිකලයක් සඳහා ... ... දෙ. බ.

---

ඇල්. ජී. ඕ.—ජීසී. 14/58.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කනදරා කෝරළයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් 3,
කොළඹදීය.

**අප්‍රසන්න වූ හා අන්තරායදායක කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,

(බී) තොග ගණනේ විකිණීම පිණිස නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,

(සී) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම,

(ඩී) විනාකිරි සෑදීම,

(ඊ) සබන් සෑදීම,

(ඇෆ්) දුම්කොළ වියලීම හෝ සකස් කිරීම,

(ජී) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,

(එච්) පුවක් වේලා සකස් කිරීම,

(අයි) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උනු කිරීම,

(ජේ) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම,

(කේ) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම,

(ඇල්) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,

(ඇම්) සෝඩා සෑදීම,

(ඇන්) ලැලි පොගවා සකස් කිරීම,

(ඕ) මාළු අයිස් දැමීම,

(පී) සුරුට්ටු, සිගරට් හෝ බීඩි සෑදීම,

(කිව්) පැණි හෝ හකුරු සෑදීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) වඩු මඩුවක් තබාගැනීම,

(බී) කොප්පරා සෑදීම,

(සී) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්‍රල් ආදී දවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්,

(ඩී) කබුක්ගල්, බොරළු, කළුගල් ලබා ගැනීමට වළවල් කැනීම හෝ වළවල් තබා ගැනීම,

(ඊ) මිනිරන් වියලීම හෝ ගබඩා කිරීම,

(ඇෆ්) වළක් කැනීමෙන් හුණු ගල් ලබා ගැනීම,

(ජී) හාල් හෝ වී මෝලක් තබා ගැනීම,

(එච්) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල් තෙල් සිඳීම,

(අයි) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම,

(ජේ) දර හෝ ලී මඩුවක් තබා ගැනීම,

(කේ) කෙඳි වගී නෙලීම හෝ ගබඩා කිරීම,

(ඇල්) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම,

(ඇම්) භූමි තෙල් ගබඩාවක් තබා ගැනීම,

(ඇන්) මුද්‍රණාලයක් තබා ගැනීම,

(ඕ) කපාපු පොල් සකස් කිරීම,

(පී) ස්වර්ණාභරණ සෑදීම,

(කිව්) අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම,

(ආර්) අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් තබා ගැනීම,

(ඇස්) කොප්පරා ගබඩා කිරීම,

(ටී) පොල් කටු අඟුරු ගබඩා කිරීම,

(යූ) කම්හලක් තබා ගැනීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායක හා අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) කෙඳි වගී සායම් කිරීම,

(බී) ගඩොල් හෝ උළු පිච්චීම,

(සී) බැටරි චාර්ජ් කිරීම,

(ඩී) අඟුරු සඳහා පොල් කටු පිච්චීම,

(ඊ) හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

---

ඇල්. සී.—බී. 54/49/ඇල්. ජී. සී.—ජීඒ. 11/39/5.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ ගම්කායී සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායීංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් 30 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථාව

1952කේ අප්‍රේල් මස 25 වැනි දින අංක 10,385 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථා මෙහි පහත සඳහන් පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ. එනම් :—

(1) 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ (සී) වැනි ඡේදයේ "උපලේඛනයේ සඳහන් "ඒ" අක්ෂරය දරණ ආකෘති පත්‍රය අස්කොට, ඒ වෙනුවට "ඒ" අක්ෂරය දරණ උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රය" යන වචන යෙදීමෙනි.

(2) 8 වැනි අතුරු ව්‍යවස්ථාවේ "උපලේඛනයේ සඳහන් "ඒ" අක්ෂරය දරන ආකෘති පත්‍රය" යන වචන අස්කොට ඒ වෙනුවට "ඒ" අක්ෂරය දරණ උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රය" යන වචන යෙදීමෙනි.

(3) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ "උපලේඛනයේ සඳහන් "බී" අක්ෂරය දරණ ආකෘති පත්‍රය" යන වචන වෙනුවට "බී" අක්ෂරය දරණ උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රය" යන වචන යෙදීමෙනි.

(4) ඊට යාකොට ඇති උපලේඛනය අස්කොට පහත සඳහන් උපලේඛනය යෙදීමෙනි :—

### "ඒ" උපලේඛනය

ආකෘති පත්‍රය

අංකය :————.

ඡන්දදායක කොට්ඨාශය :————.

**බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ ගම්කායී සභාව**

රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ නම :————.

ගම :————.

ලිපිනය :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය) |
|---|---|---|
| කරත්ත, තිරික්කල, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක රථ වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බර බාග හෝ තිරික්කල ... ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි .... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත්, මම මෙයින් සහතික කරමි.

————,
අයිතිකරුවාගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපා හරින්න.

### "බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | බු. වැ. ර. |
| සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | බු. වැ. ගො. දෙ. ක. |
| සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | බු. වැ. ත. ගො. ක. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | බු. වැ. රි. |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | බු. වැ. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | බු. වැ. පා. පැ. |

---

# විවිධ දැන්වීම්

## හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම්කායී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන්මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම්කායී සභා සීමා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ

අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම් දෙමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. මැතිව් ප්‍රනාන්දු,
ගම්කායඞ සභාපති.

නොවැම්බර් 3, 1958.
ගම්සභා කායඞාලය,
හත්තිනිය, මාරාවිල,

## උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|---|
| 1. | ඇල්. ඒ. හියුබට් ප්‍රනාන්දු, වීරහේන, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් මාර්කට් එක, මාරාවිල |
| 2. | ඇම්. එච්. විල්ප්‍රඩ් අප්පුහාමි, මූදුකටුව, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '', නො. 13, මාර්කට් එක, මාරාවිල |
| 3. | ඩබ්ලිව්. එම්මානුවෙල් ප්‍රනාන්දු, තිඹිරිවැව, බිංගිරිය | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '', නො. 56බී, මහ වැව |
| 4. | ඩබ්ලිව්. ඩී. ජේම්ස් අප්පුහාමි, දූනක දෙනිය, වැලිපැන්නගහමුල්ල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '', නො. 363, අඹගහ වත්ත, තොඩුවාව |
| 5. | ඇම්. එච්. ගෝමිස් අප්පුහාමි, වීර හේන, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '', මාළු මාර්කට් එක, මහවැව |
| 6. | ඇම්. එච්. ගෝමිස් අප්පුහාමි, වීර හේන, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '', තල්විල |
| 7. | ඇම්. එච්. ගෝමිස් අප්පුහාමි, වීර හේන, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස්, '' මට්ටාකොටුව |
| 8. | කේ. ඊ. දල්පතාදු, පල්ලිය පාර, මාරාවිල | '' හරක්මස්, එළුමස් හා ඌරු මස් '' පල්ලිය පාර, මාරාවිල |

---

## හංවැල්ල උඩුගහ පත්තු ගම්කායඞ සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1959 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බල පත්‍ර ඉල්වා අයදුම් පත්‍ර මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශොධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශොධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

2. එකී බල පත්‍ර නිකුත් කිරීම ගැන හංවැල්ල උඩුගහ පත්තු ගම් කායඞ සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඬ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුඬ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

කේ. පී. මර්තීනු අප්පුහාමි,
ප්‍රධාන තැන,
හංවැල්ල උඩුගහ පත්තු ගම්කායඞ සභාව.

ගම්කායඞ සභා කායඞාලය,
බොරලුගොඩ, කොස්ගම,
5. 11. 1958.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය සහ වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඩී. ජුසේ අප්පුහාමි | ... | කහහේන ප්‍රසිඬ මාකට්හි හරක් මස් කඩය. |
| 2. ඇම්. ඩී. ජුසේ අප්පුහාමි | ... | කොස්ගම ප්‍රසිඬ මාකට්හි හරක් මස් කඩය. |
| 3. ඇම්. ඩී. තෝමස් අප්පුහාමි | ... | පුවක්පිටිය ප්‍රසිඬ මාකට්හි හරක් මස් කඩය. |
| 4. ඇම්. ඇම්. ඉස්මේල් | ... | වැලිකන්න නො. 104, හරක් මස් කඩය. |
| 5. ඇම්. ඇම්. ඉස්මේල් | ... | තිරිපොල කහටගහවත්තේ හරක් මස් කඩය |
| 6. ඇම්. ඇම්. ඉස්මේල් | ... | තිරිපොල පට්ටිවිල වත්තේ හරක් මැරීම. |

## පනාවල් කෝරළේ ගම්කායඞ සභාව—පනාවල

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් හරක් මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව පනාවල් කෝරළේ ගම් කායඞ සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලිය විල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥා පනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. සී. පෙරේරා,
පනාවල් කෝරළයේ ගම්කායඞ සභාවේ
ප්‍රධාන තැන.

ගම්කායඞ සභා කායඞාලය,
පනාවල, 1958. 11. 1 වැනි දින දීය.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. ඉසෙඩ්. ඇම්. ඇම්. ෂරිප් | ... | අංක 26, ජම්බුගහ වත්ත, අස්ගඟුල | හරක් මස් |
| 2. ඩී. ඇල්. ඇම්. සහීඩ් | ... | අංක 1, බෙන්දලුව හේන, පරකඩුව | හරක් මස් |

---

## නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1959 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශොධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශොධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන නාරම්මල ගම් ප්‍රදේශයේ ගම් කායඞ සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට 28 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

පී. බී. මැදගොඩ,
නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාවේ
සභාපති තැන.

වර්ෂ 1958 ක්වූ නොවැම්බර් මස 8 වෙනි දින,
නාරම්මල ගම්කායඞ සභා කායඞාලයේ දීය.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. අබ්දුල් ලතීබු, මීගමුපාර, නාරම්මල | අංක 5/79, මීගමු පාර, නාරම්මල | එළු මස් සහ හරක් මස් |

---

## අටුලුගම් කෝරළේ ගම්කායඞ සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව අටුළුගම් කෝරළේ ගම්කායඞ සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය

තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

මා. ග. ජයවර්ධන,
අටුළුගම් කෝරළේ ගම්කායයීි සභාවේ ප්‍රධාන නැන.

ගම්කායයීි සභා කායයීාලය,
දෙහිඕවිට,
1958. 11. 3 වැනි දින දීය.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඇල්. ඇම්. මවුජුට්, ගරාගොඩ, යටියන්තොට | අංක 72, ගරාගොඩ... | හරක්මස් |
| 2. ඇම්. ඇස්. ඒ. පලීල්, අංක 137, ගරාගොඩ, යටියන්තොට | අංක 69, ගරාගොඩ... | හරක්මස් |

---

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 යේ වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්කායයීි සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුන නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඞී. බී. හේරත්,
ගම්කායයීි සභාපති නැන,
වැල්ලව.

ගම්සභා කායයීාලය,
මරළුවාව, කුරුණෑගල,
1958 නොවැම්බර් මස 4.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| (1) කේ. ඒ. ජබ්බාර් | ... | 17/2, නුවර පාර, මල්ලවපිටිය | හරක් මස් |
| (2) ඇම්. මීරා ලෙබ්බෙ | ... | දන්ගහමුලවත්ත, තෝරයාය | එම |
| (3) ටී. යූ. ඒ. කරීම් | ... | 14/7, මැහියල්ල පාර, මල්ලවපිටිය | එම |
| (4) ටී. යූ. ඒ. කරීම් | ... | මාර්කට් එක, වැල්ලව ... | එම |
| (5) ටී. යූ. ඒ. කරීම් | ... | මාර්කට් එක, වැල්ලව ... | එලු මස් කඩය |

---

## කුරුවිටි කෝරළේ පල්ලේ පත්තු ගම්කායයීි සභාව—ඇහැලියගොඩ

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් හරක් මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුවිට කෝරළේ පල්ලේ පත්තු ගම්කායයීි සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවනතේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම්දෙමි.

ජී. එච්. පොඩියා,
කුරුවිට කෝරළේ පල්ලේ පත්තු ගම්කායයීි සභාවේ ප්‍රධාන නැන.

ගම්කායයීි සභා කායයීාලය,
ඇහැලියගොඩ, 5. 11. 58.

## උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | | ස්ථානය හා වෙළඳාම |
|---|---|---|
| 1. ඞී. ඇල්. ඇම්. සාහිඞ්, විලේගොඩ, ඇහැලියගොඩ. | ... | කැන්දන්ගමුව ඉහලගම—පිච්චතම්බිගේ වත්ත, "හරක් මස්" |
| 2. ඉසැඞ්. ඇම්. ඇම්. ෂරීප්, විලේගොඩ, ඇහැලියගොඩ | ... | මෝරාගල, අංක 62 දරණ ස්ථානයේ, "හරක් මස්" |

---

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඞ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.